**08-11-2024 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ මෙම රාජයෝගය ඉගෙන ගන්නේ රාජධානියක් අත්කර ගැනීම සඳහා වේ. මෙය ඔබට නව අධ්‍යාපනයකි.

**ප්‍රශ්නය:** ඇතැම් දරුවන් ඉගෙන ගනිමින් සිටිනා අතරේ ම අසමත් වන්නේ ඇයි?

**පිළිතුර:** ඔවුන් ඉගෙන ගනිද්දී, මායා සමඟ ඔවුන්ට බොක්සින් තරඟයක් ඇති වෙයි. ඔවුන් මායා හා බොක්සිං තරඟයේ යෙදෙන විට බුද්ධිය බරපතල ලෙස රිදවා ගනී. එමනිසා, රිදවාගත් හේතුවෙන්, පියාට අවංකව සිටීමට ඔවුන්ට නොහැකි වෙනවා. අවංක දරුවන් නිරන්තරයෙන් සුරක්ෂිතව සිටිති.

ඕම් ශාන්ති. ඔබ ජීවාත්මයන්ට උගන්වන්නේ එම පරම්පිතා පරමාත්මයයි යන විශ්වාසය ඔබ සියලුම දරුවන්ට තිබෙනවා. මේ අසීමිත පියා සෑම වසර 5000කට වතාවක් ම පැමිණ ඔබ අසීමිත දරුවන්ට උගන්වයි. මෙය නවකයෙක් ඇසුවොත් ඔවුන්ට වටහාගත නොහැකි වේවි. ඔවුන්ට ආධ්‍යාත්මික පියා කවුද එසේම ආධ්‍යාත්මික දරුවන් කවුද යන්න වටහාගත නොහැකි වනු ඇත. ඔබ සැවොම සහෝදරයින් සහ ඒ කෙනා ඔබේ පියා, ගුරුවරයා සහ පරම ගුරු බව ඔය දරුවන් දන්නවා. ඔය දරුවන්ට නිසැකවම ඉබේම වාගේ මතක් වෙයි. මෙහි ඉදිද්දී සියලූ ජීවාත්මයන්ටම ඇත්තේ මේ එකම එක ආධ්‍යාත්මික පියා පමණයි යන්න ඔබ වටහාගනී. ඔවුන් මොන ආගමට අයිති වුණත්, සියලු ජීවාත්මයන් සිහිපත් කරන්නේ ඔහුවයි: සියලු මනුෂ්‍යයන් අනිවාර්යෙන්ම ඔහුව සිහිපත් කරති. සෑම කෙනෙක් තුළම ජීවාත්මයක් ඇත කියා පරම පියා පැහැදිලි කර තිබෙනවා. පරම පියා දැන් කියනවා: සියලු ශරීරයේ ආගම් අත්හැර තමාව ජීවාත්ම වශයෙන් සලකා ගන්න. මෙහිදී දැන් ඔබ ජීවාත්මයන් තමන්ගේ කොටස් රඟපාමින් සිටින්නේ. ඔබ රඟපාන කොටස් ගැනත් ඔබට පැහැදිලි කර තිබෙනවා. ඔය දරුවන් මෙය වටහාගන්නේ අංක අනුපිළිවෙලින්, ඔබ කරන උත්සාහයට අනුවයි. ඔබලා රාජයෝගීන්. ඉගෙන ගන්නා සියල්ලන්ම යෝගීන්ය. අනිවාර්යෙන්ම තමන්ට උගන්වන ගුරුවරයා සමඟ යෝග වෙති. ඔවුනුත් තම ඉලක්කය සහ අරමුණ ගැන අවබෝධයෙන් සිටින්නේ: ඔවුන්ගේ ඉගෙනුම තුළින් කවුරුන් වේද යන්න ඔවුන් දනී. මෙහි ඇත්තේ එක් පාඩම වන අතර එය හඳුන්වන්නේ රජවරුන්ගේ රජ බවට පත්වීමේ අධ්‍යාපනය කියායි. මෙය රාජයෝගාවයි. අධිරාජ්‍යයක් අත්කර ගැනීම සඳහා ඔබ පරම පියා සමඟ යෝගා කරයි. කිසිම මනුෂ්‍යයෙකුට මෙම රාජයෝගාව උගැන්විය නොහැකියි. ඔබට උගන්වන්නේ මනුෂ්‍යයෙක් නොවෙයි. ඔබ ජීවාත්මයන්ට උගන්වන්නේ පරමාත්මයයි. ඔබද තමන් ජීවාත්මයන් යැයි සලකාගත යුතුයි. පරම පියා අප ජීවාත්මයන්ට උගන්වනවා. මෙය සිහිපත් නොකරන හේතුවෙන් බලය එකුතු වෙන්නේ නැහැ. මෙන්න මේ නිසායි. බොහෝ දෙනෙකුගේ බුද්ධියෙහි නොරැඳී තිබෙන්නේ. ඉතින්, පරම පියා සැමවිටම කියන්නේ: සදා යෝගාවෙහි නියැළී ස්මරණ වන්දනාවේ ඉඳ ඉන්පසු පැහැදිලි කරන්න. මා ඔබ සහෝදරයන්ට උගන්වනවා ඔබ සෑම කෙනෙක්ම ජීවාත්මයක් වන අතර ඔහු සැමගේ පියා. ගුරුවරයා සහ සත්ගුරු වේ. ඔබ සෑම කෙනෙක්වම ජීවාත්මයක් ලෙස බලන්න ඕන. තත්පරයකින් මුක්තිය සහ ජීවන්මුක්තිය ගැන කියා ඇති මුත් ඊට බොහෝ සෙයින් උත්සාහ දැරීම අවැසි වේ. ජීවාත්ම අවධානයට පත් නොවන නිසා ඔබේ වචන තුළ බලයක් නොතිබේ. එබැවින්. ඔබට පියා පැහැදිලි කරන ආකාරයෙන් පැහැදිලි කිරීමට නොහැකි වෙයි. සමහරු ඉතා හොඳින් පැහැදිලි කරයි. කටු කවුද මල් කවුද යන්න ඉන් වටහාගත හැකි වේ. පාසලක ඉගෙන ගන්නා දරුවන් පස්වන හෝ සයවන පන්තියෙන් පසු ඔවුන්ව තැන් මාරු කරයි. හොඳ දරුවන් මාරු වී යන විට, අනෙක් පන්ති වල ගුරුවරුන්. කොයි දරුවන් ඉතා හොඳින් උත්සාහ කර තිබේද කොයි දරුවන් විශිෂ්ට ලෙස ඉගෙනගෙන ඉහළින් ලකුණු ලබාගෙන තිබේද යන්න එසැන වටහා ගනිති. ගුරුවරයෙක් මෙය අනිවාර්යෙන් වටහාගනී. ඒවා ලෞකික ඉගෙනීමයි. මෙය පාරලෞකික ඉගෙනුමයි. මෙහිදී, ඔබට මෙසේ කිව නොහැකියි: කෙනෙක් කලින් හොඳාකාරව ඉගෙනගත්තා නම්, ඔහු දැනුදු හොඳින් ඉගෙන ගනී කියා; නැහැ. එහිදී, ශිෂ්‍යයෙක් තැන් මාරු වෙන්නේ විභාගයකින් පසුවයි. එබැවින් ඔහු හොඳ උත්සාහයක් කර ඇති බවත් ඒ නිසා ඉහළින් ලකුණු ගෙන ඇති බවත් ගුරුවරයා වටහා ගනී. මෙහි. මෙය අලුත් අධ්‍යාපනයකි. මෙය කලින් කිසිම කෙනෙක් ඉගෙන නොගෙන ඇත්තේ මෙය අලුත් අධ්‍යාපනයක් නිසායි. උගන්වන කෙනාත් අලුත් කෙනෙක්; සියල්ලක්ම අලුත්. ඔහු අලුත් අයටයි උගන්වන්නේ, ඒ අයගෙනුත් හොඳින් ඉගෙන ගන්නා අයව හොඳ උත්සාහකරුවන් ලෙස හඳුන්වයි. මෙය අලුත් ලොවට ඇති අලුත් දැනුමයි. අන් කිසිම කෙනෙක් නොවෙයි ඔබට උගන්වන්නේ. ඔබ ඉගෙනුමට

බොහෝ අවධානය දෙන්නේ ද. ඔබ ඉහළ අංකයක් ලබාගනී. සමරු ඉතා සුමිහිරියි. කීකරුයි. දුටු සැනින්ම. ඒ අය තමයි හොඳින් උගන්වන්නේ කියා ඔබට දැනේ. ඔවුන්ගේ හැසිරීමෙන් සහ කතා කරන විලාශයෙන් ඔවුන්ට අඩුපාඩු නැති බව ඔබට වටහාගත හැකි වේ. බාබා සැමගෙන් අසයි: කොහොමද එයා උගන්වන්නේ? එයා තුළ අඩුවක් තියෙනවා ද? බොහෝ දෙනෙක් කියනවා මුලින්ම තමන්ගෙන් නොඅසා බාබාට තොරතුරු දෙන්න එපා කියා. සමහරුන්ට ඉතා හොඳින් උගැන්විය හැකියි. එහෙත් අන් අයට තියුණු බුද්ධි නොතිබෙයි. ඒ අය මායාගෙත් නොසැහෙන්න ගුටි කාපු අය වේ. මායාගෙත් විශාල වශයෙන් රැවටිලා ඇත්තේ කවුද කියා පියා දන්නවා. ඒ අය වසර දහයක් පමණ උගන්වමින් සිටියා වුවද ඔවුන් ශරිර අවධානයට පත්වෙන්නත් උගුලට අසුවෙන්නත් තරම් මායා එපමණ බලවත් වේ. පරම පියා පැහැදිලි කරන්නේ ඒ සියලු ශක්තිමත් අය මායා විසින් රිදවනු ලැබූ අයයි. මායාත් බලවත් වී බලවත් අය සමඟ සටන් කරනවා. බාබා ඇතුල් වූ කෙනා අංක එකටත් ඔහුගෙන් පසු බොහෝ දෙනෙක් අංක පිළිවෙලටත් සිටින බව ඔබට වැටහෙයි. බාබා උදාහරණ එකක් දෙකක් දුන්නත් එහි අංක අනුපිළිවෙලට බොහෝ දෙනෙක් සිටිනවා. දිල්ලියෙහි ගීතා දැරිය ඉතා දක්ෂයි. ඇය ඉතා සුමිහිරි දැරියකි. බාබා සැමවිටම කියයි සත්‍ය ගීතාව මේ ගීතා තමයි කියා. මිනිස්සු ගීතාව කියවන නමුත් දෙවියන් රාජ යෝග කෙසේ උගැන් වූවාද කෙසේ ඔබව රජවරුන්ගේ රජවරු බවට පත්කළේ ද යන්න ඔවුන්ට නොවැටහේ. ස්වර්ණම යුගය පැවැති කාලයේ සැබැවින්ම තිබුණේ එක් ධර්මයයි. එය පෙරදා සිදුවූ දෙයකි. පරම පියා කියයි මා ඔබව ඉතා ධනවත් කරවූවා. කෝටි ප්‍රකෝටි වාරයක් භාග්‍යවන්ත වූවා. දැන් බලන්න ඔබ කවුරුන් වී සිටී ද කියා. මෙය ඔබට දැනෙනවා. වෙනත් ගීතාව පවසන්නන් ගෙන් ඔබට කිසිම හැඟීමක් දැනීමක් ඇති වන්නේ නැහැ. ඔවුන්ට යාන්තමින් වත් වැටහීමක් නොතිබේ. ඔවුන් ඉතා උසස් අන්දමින් ශ්‍රීමත් භගවත් ගීතාව සිහිපත් කරති. ඔවුන් ගීතාව හොඳින් ඉගෙන ගත් පසු එය අන් අයට පවසයි. පරම පියා මොනම පොතක් වත් ගන්නේ නැහැ; එහි වෙනසක් ඇත. ඔවුන්ට කිසිසේත් ස්මරණ වන්දනාව නොතිබේ: ඔවුන් දිගටම වැටෙයි. සර්වව්‍යාප්තිය නම් සංකල්පය තබාගත් නිසා ඔවුන් සැම මොන තත්ත්වයට පත්වී ඇත්ද කියා බලන්න! මෙය චක්‍රයක් චක්‍රයක් පාසා සිදුවන බව ඔබට වැටහෙයි. පරම පියා කියයි: මා ඔබට උගන්වා ඔබව මේ විෂ සයුරෙන් එතරට ගෙන යනවා. එහි තිබෙන්නේ විශාල වෙනසකි. වේද ග්‍රන්ථ වල ඉගෙනුම භක්ති මාර්ගයයි. පරම පියා කියයි: කිසිම කෙනෙක් නොවෙයි එම වේද ග්‍රන්ථ කියවීමෙන් මා හමුන්නේ. ඔවුන් සිතනවා මොන මාර්ගයේ ගියත් සියල්ලන්ම එකම තැනට සේන්දු වෙයි කියා. ඇතැම් විට ඔවුන් කියනවා, දෙවියන් කුමක් හෝ රූපයකින් ඇවිත් අපට උගන්වනවා ඇත කියා. ඒ හෙයින්, පරම පියා උගන්වන්නට තිබෙද්දී ඔවුන් උගන්වන්නේ කුමක් ද? පරම පියා කියනවා, පිටි මුට්ටයක ලුණු ස්වල්පයක් තිබෙනා තරමට ගීතාවෙහි සත්‍ය වදන් කීපයක් තිබෙනවා කියා. එයින් ඔබට එම කරුණු අරගත හැකියි. ස්වර්ණම යුගයෙහි වේද ග්‍රන්ථ ආදී කිසිවක් නොතිබෙයි. මේ ග්‍රන්ථයන් අයිති භක්ති මාර්ගයටයි. ඔබට කිව නොහැකියි. ඒවා අනාදිමත් කාලයේ සිටම, ආරම්භයේ සිටම පැවත එනවා කියා: නැහැ. අනාදිමත් යන්නෙහි අර්ථය ඔවුන් නොදනී. පරම පියා මෙම සදාතනික නාටකය සැබැවින්ම සදාතනිකව පවතී කියා පැහැදිලි කරනවා. පරම පියා ඔබට රාජයෝගා උගන්වයි. ඔහු කියයි: මා දැන් ඔබට උගන්වා පසුව මා අතුරුදහන් වෙනවා. ඔබේ රාජධානිය සදාතනිකයි කියා ඔබ කියනවා. මේ එම රාජධානියමයි. හුදෙක් නම පමණක් වෙනස් වී ඇත. මන්ද යත්, එය පවිත්‍රත්වයෙන් අපවිත්‍ර වී තිබේ. දේවතාවරුන් යැයි කියනවා වෙනුවට ඔබ හින්දුවරු යැයි කීවා. එහෙත් ඔබ තවමත් අයත් වන්නේ ආදී සනාථන දේවතා ධර්මයටයි. හුදෙක් අන් අය කෙසේ සතෝප්‍රධාත්, සතෝ, රජෝ සහ තමෝ යන තත්ත්ව හරහා යන්නේ ද ඔබත් ඒ අයුරින්ම පහළට එනවා. ඔබ අපවිත්‍රතාවය නිසා රජෝ බවට පත්වන විට දේවතාවන් යැයි කියනවා වෙනුවට හින්දුන් යැයි කීවා. එනමුත් ඇත්තෙන්ම එය. හින්දු යන නාමය. හින්දුස්ථාන් දේශයට අයත් වූ නිසායි. මුලින්ම, ඔබ දේවතාවරුන් වී සිටියේ. දේවතාවරු සැම විටම පාරිශුද්ධයි. මනුෂ්‍යයන් දැන් අපවිත්‍ර වූ හෙයින් ඔවුන්ට හින්දු යන නාමය දී ඇත. ඔවුන්ගෙන් අසන්න: හින්දු ධර්මය නිර්මාණය වුණේ කවදාද සහ කවුරු විසින් එය නිර්මාණය කළා ද? ඔවුන්ට ඊට පිළිතුරක් නොතිබේවි. ආදි සනාථන දේවි දේවතා ධර්මය තිබුණි. එයට පාරාදීසය මෙන්වූ බොහෝ සුන්දර නම් දී තිබේ. අතීතය වූ එම දේවල් යළි ආවර්ථනය වේ. මෙකල්හී. ඔබ මුල සිට අග පිළිබඳ සියල්ල දැන සිටී. එසේ තව තවත් දැනගනිද්දී, ඔබ ජීවත් වේවි; ඇතැමුන් මියගොස් සිටී. මායා හා ඔබේ සටන ආරම්භ වූයේ ඔබ පරම පියාට අයිති වූ දා සිටමයි. එහෙත් සමහරු ද්‍රෝහීන් බවටත් පත්වුණා. ඔබ අයිති වී සිටියේ රාවණාටයි පසුව රාමාට අයිති වුණා. ඉන්පසු රාමගේ (දෙවියන්ගේ) දරුවන්ව රාවණ පරාද කොට ඔහු වෙතට අරගනී. සමහරු ලෙඩරෝග වී එහෙටත් අයති නොවී මෙහිත් නැවිත් ඉඳී. විනෝදයක් ලබන්නේ හෝ දුක අත්විඳින්නේ නැතිව අතර මැදිව සිටිති. ඔබ අතරේත්, එවැනි අතර මැදි වූවන් බොහෝ සිටිනවා; ඔවුන් පියාට සම්පූර්ණයෙන් අයිති වන්නේත් නැහැ. රාවණට සම්පූර්ණයෙන් අයිති

වන්නේත් නැහැ. ඔබ දැන් සිටින්නේ ඉතාමත් ශුභ කාලය වූ සංගම යුගයේයි. ඔබ උත්සාහ දරමින් සිටින්නේ උසස්ම මනුෂ්‍යයන් වීමටයි. මේ කාරණා ඉතා හොඳින් වටහාගත යුතුයි. බාබා ඔබෙන් යමක් ඇසූ විට, ඔබ දරුවන් බොහෝ දෙනෙක් අත් ඔසවන නමුත් ඔබට ඒ තරම් බුද්ධියක් නොමැති බව වටහාගත හැකියි. බාබා කියයි: කොහොමනමුත් ශුභ දේවල් කියන්න. ඔබ සැම කියන්නේ ඔබ සාමාන්‍ය මනුෂ්‍යයාගෙන් නාරායන් බවට වෙනස් වෙනවා කියායි. සාමාන්‍ය නරයෙක් නාරායන් බවට වෙනස් වූ කතාවක් ඇත. අවිද්‍යා මාර්ගයේ, ඔබ සත්‍ය නාරායන්ගේ කථාව අසා සිටි මුත් කිසිවකුටත් මෙසේ ප්‍රශ්න කිරීමට නොහැකි වුණි. මෙහිදී පියා ඔබෙන් අසනවා: ඔබ මොනවද සිතන්නේ? ප්‍රමාණවත් ධෛර්යයක් ඔබට තිබෙනවාද? අනිවාර්යෙන්ම ඔබ පාරිශුද්ධ වෙන්න ඕන. යම් කෙතෙක් පැමිණි විට ඔහුගෙන් අසන්නේ: මේ උපතේ දී ඔබ යම් පවක් කර තිබේ ද? සැවොම උපතක් උපතක් පාසා පව්කාරයන් වී ඉඳ ඇත. ඔබ මේ උපතේ පව් ගැන කතා කළොත් ඔබ සැහැල්ලුවට පත්වෙයි. එසේ නැති කොට, ඔබේ හෘදසාක්ෂියම ඔබට වදදෙයි. ඇත්ත පැවසීමෙන් ඔබ සැහැල්ලු වෙයි. ඇතැම් දරුවන් ඇත්ත නොකියති. ඒ නිසා මායා ඔවුනට මිටින් තදින්ම ඇනී. ඔබේ බොක්සින් තරඟය හරිම සැර එකකි. ඉන් ඔබේ ශරීරයයි රිදෙන්නේ. එහෙත් මෙහි දී ඔබේ බුද්ධියයි ඉතා තදින්ම රිදවා ගන්නේ. මෙය බාබාත් දන්නවා. මේ බ්‍රහ්මා කියයි: මාගේ බොහෝ උපත් වලින් මේ අවසාන උපතයි ගෙන ඇත්තේ. මා ඉතාමත් පාරිශුද්ධවයි සිටියේ දැන් ඉතාමත් අපිරිසිදු වී සිටිනවා. නැවත වතාවක් මා පාරිශුද්ධ වෙනවා. මා ශ්‍රේෂ්ඨ ආත්මයක් කියා මා කියන්නේ නැහැ. පරම පියා මෙය තහවුරු කළා එසේම කීවා: අන්තිම අපිරිසිදු කෙනාත් මොහුමය කියා. පරම පියා කියයි: මා පිට දේශයෙන් පැමිණ පිට දේශ ශරීරයකට ඇතුල් වුණා. මා ඇතුල් වුණේ උපත් 84ක් සම්පූර්ණ කළ තැනැත්තාගේ අන්තිම උපතේ දීයි. ඔහු දැන් නැවත වතාවක් පාරිශුද්ධ වීමට උත්සාහ දරමින් සිටිනවා. ඔබ ඉතාමත් ප්‍රවේසම් වෙන්න ඕන. මෙය පරම පියා දනී. බාබාගේ මේ දරුවා ඉතා සමීපයි. කිසිසේත් පරම පියාගෙත් ඔහුව වෙත් කළ නොහැකියි. ඔහුව අත්හැර යෑම ගැන මට සිතන්නවත් බැහැ. ඇත්තෙන්ම ඔහු මා ළඟින්ම සිටිනවා. බාබා මගේයි. ඔහු මගේ නිවසේ සිටිනවා. බාබා මෙය දනී. ඔහු බාබා සමඟ විහිළු තහළු කරමින් සිනාසෙයි. මොහු කියයි: බාබා අද ඔයාට මාව නාවන්න පුළුවන්. මට කවන්න පුළුවන්. මා ඔබේ පුංචි දරුවා. බාබාව නොයෙක් අන්දමින් මා සිහිපත් කරනවා. ඉන්පසු ඔය දරුවන්ටත් පැහැදිලි කරනවා. මේ අයුරින් බාබා සිහිපත් කරන්න. බාබා. ඔබ හරිම සුමිහිරි කෙනෙක්. ඔබ අපව ලොවේ අධිපතීන් කරවනවා. වෙන කාගේවත් බුද්ධි වල මේ දේවල් තිබිය නොහැකියි. පරම පියා ඔබ සැවොම නොකඩවා ප්‍රබෝධමත් කරනවා. ඔබ සැම ද නොකඩවා උත්සාහ දරණවා එහෙත් ඔබේ හැසිරීම් ද ඒ අනුව තිබිය යුතුයි. අත්වැරැද්දක් සිදුවූ සැනින්ම බාබාට ලියන්න. බාබාට කියන්න: බාබා. මේ වැරැද්ද මා අතින් සිදුවුණා. සමහරු ලියනවා: බාබා මා වැරැද්දක් කළා මට සමාවෙන්න! මාගේ දරුවෙක් වුණාට පසුව වැරැද්දක් කරනවා නම් එම වැරැද්ද සිය වාරයකින් වැඩි වනු ඇත. ඔබ මායාට පැරදුනොත් ඔබ කළින් සිටි තත්ත්වයට පත්වෙයි. බොහෝ අය පරාජිත වුණා. මෙය ඉතා බලවත් බොක්සින් තරඟයකි. එය රාම සහ රාවණ අතර සටනකි. දෙවියන් වඳුරු සේනාවක් අරගත්තා කියා ඔවුන් පෙන්වා ඇත. එය දරුවන් සඳහා නිර්මාණය කළ නාට්‍යයක්. කුඩා දරුවන්ට ලොකු වැටහීමක් නොතිබෙයි. පරම පියා කියයි: ඒ මිනිසුන්ගේ බුද්ධින් සුළු පැන්ස ගණනක් වටින්නේ. ඔවුන් කියනවා සැම කෙනාම දෙවියන්ගේ ස්වරූපයක් කියායි. එහි අරුත සැම කෙනාම දෙවියන් වී නිර්මාණය. පෝෂණය සහ විනාශය සිදු කරනවා කියන එකද? දෙවියන් කිසිවක් විනාශ කරන්නේ නැහැ. එසේ කීම එවන් අඥානකමකි! ඒ නිසායි මිනිස්සු බෝනික්කෝ තියාගෙන වඳිනවා කියා කීවේ. හරිම පුදුමයි මේ මිනිසුන්ගේ බුද්ධි වලට කුමක් වීද කියා. ඔවුන් බොහෝ මුදල් වැය කරති! පරම පියා චෝදනා කරමින් ඔබට කියන්නේ: මා ඔබව ඉතා ශ්‍රේෂ්ට කළා එහෙත් ඔබ මොනවද කළේ? ඔබ දේවතාවරු වී සිටියා කියාත් ඔබ චක්‍රය වටා ගමන් කර දැන් බ්‍රහමින් වී සිටින වගත් ඔබට වැටහෙනවා. අනතුරුව ඔබ නැවත දේවතාවරු බවට පත්වෙනවා. මෙය ඔබේ බුද්ධි තුළ තිබෙන්නම ඕන. ඔබ මෙහි ඉඳිද්දී ඔබේ බුද්ධි තුළ මෙම දැනුම රැඳී තිබිය යුතුයි. බාබා දැනුමින් පිරි කෙතෙකි. ඔහු ශාන්ති දාමයේ සිටියා වුවත් ඔහුට ඥානයෙන් පිරි කෙනා කියති. ඔබු ජීවාත්ම තුළත් සියලු දැනුම ඇත. මිනිස්සු කියනවා. මෙම දැනුම තුළින් ඔවුන් ගේ දැස් විවර වුණා කියා. පරම පියා ඔබට ඥාන ඇසක් දුන්නා. ජීවාත්මයට දැන් ලොවේ මූල. මැද සහ අග පිළිබඳ දැනුම ඇත. චක්‍රය දිගටම කැරකෙයි. ස්වදර්ශන චක්‍රය ලැබුණේ බ්‍රහමින්වරුන්ටයි. දේවතාවරුන්ට උගන්වන්නට කෙනෙක් නොසිටී; ඔවුන්ට මොන ඉගෙන්වීමක් වත් අවශ්‍ය නොවේ. දේවතාවරු බවට පත්වන ඔබයි ඉගෙන ගත යුත්තේ. පරම පියා මෙහි ඉඳිමින් මේ අලුත් දේවල් ඔබට පැහැදිලි කරනවා. මේ අලුත් දැනුම ඉගෙන ගැනීමෙන් ඔබ ඉතා උසස් අය බවට පත්වෙනවා. පළමු අංකයේ සිටි අය අන්තිම වෙනවා අන්තිම අංකයේ සිටිත අය පළමු අංකයට පත්වෙනවා. මෙය ඉගෙනුමක්. සැම චක්‍රයේම බාබා පැමිණ ඔබව අපවිත්‍ර බවෙන් පවිත්‍ර කරන බව ඔබට දැන් වැටහෙයි. ඉන්පසු මෙම ඉගෙනුම අවසන් වෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබ ඉතාමත් කීකරුව සහ සුමිහිරිව සිටින්න. මොනයම් ශරීරයේ අහංකාරයට වත් ඉඩ නොදෙන්න. පරම පියා ට දරුවෙක් වූවාට පසුව අත්වැරැදි කිසිවක් නොකරන්න. මායා හා බොක්සිත් කිරීමේ දී ඔබ ඉතා ප්‍රවේසම් වෙන්න ඕන.
2. ඔබේ වචන බලවත් කර ගැනීම සඳහා ජීව අවධානයෙහි සිටීම පුහුණු වන්න. ඔබ පවසන මේ දෙය පරම පියා ඔබට උගැන්වූ දෙයක්ය කියා ඔබේ අවධානයෙහි තිබෙත්වා. එවිට ඔබේ වචන වල බලය තිබේවි.

**වරදානය:** දේවදූතයෙකු බවට පත් වී අධ්‍යාත්මික සතුට හා ප්‍රීතිය අත්විඳිය යුතු බ්‍රාහ්මණයෙකු වීමේ නොනැසී පවතින කුල්මත්භාවය ඔබ පවත්වා ගනීවා.

ඔබ බ්‍රාහ්මණයින්, දේවදූතයන් වීමට නියමිත ඔබ දිව්‍යත්වයටත් වඩා උසස් ය. දිව්‍ය ජීවිත තුළ පරමාත්ම පියා පිළිබඳ දැනුම මතු නොවනු ඇත. පරමාත්ම දෙවියන් හමුවීමේ අත්දැකීමක් පවා නොලැබෙනු ඇත. එබැවින්, දැන්, ඔබ දේවදූතයන් බවට පත්වන, දිව්‍යත්වයටත් වඩා උසස් බ්‍රහ්මණයන් යැයි මත්මතත් වී සිටින්න. ඔබට අධ්‍යාත්මික සතුට හා ප්‍රීතිය අත්විඳිය හැක්කේ මෙම නොනැසී පවතින කුල්මත්භාවය පමණි. ඔබට නිරන්තරයෙන් මෙම කුල්මත්භාවය නොමැති නම්, ඔබ සමහර විට සතුටට පත් වන අතර සමහර විට ව්‍යාකූල වනු ඇත.

**පාඨය:** ඔබ ඔබේ සේවය පවා පරමාත්ම පියාට භාර දෙන විට, ඔබ කැප වූණු ජීවාත්මයක් ලෙස හඳුන්වනු ඇත.

***** ඕම ශාන්ති *****